ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025 (2026)

# 87 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

ලකුණු දීමේ පටිපාටිය




මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

Past Papers Wiki

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025 (2026)

# 87 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## I පත්‍රය

### ආවරණය කරනු ලබන ඉගෙනුම් ඵල

1. මුද්‍රණ ශිල්පය පිළිබඳ දැනුම ආවර්ජනය කරයි.
2. අන්තර් පුද්ගල සන්නිවේදනය පිළිබඳ අවබෝධය පරීක්ෂා කරයි.
3. දේශීය ගුවන් විදුලි ඉතිහාසය පිළිබඳ ආවර්ජනය කරයි.
4. සමූහ සන්නිවේදනය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
5. මුද්‍රිත ඉතිහාසය පිළිබඳ දැනුම ආවර්ජනය කරයි.
6. පුවත්පත් සංස්කරණය පිළිබඳ භාවිත ස්වරූපය ගෙන හැර දක්වයි.
7. අවාචික සන්නිවේදනය පිළිබඳ අවබෝධය පෙන්නුම් කරයි.
8. පුවත්පතක මාධ්‍යමය භාවිතය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.
9. නීත්‍යානුකූල දේශ සීමාවක් තුළ ජීවත් වන පුද්ගලයින් පිළිබඳ දැනුම ගෙන හැර දක්වයි.
10. තොරතුරු දාම පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.
11. පරිගණකය ආශ්‍රිත මුද්‍රණ යන්ත්‍ර පිළිබඳ අවබෝධය ගෙන හැර දක්වයි.
12. පුවත්පත් සම්බන්ධ නඩු කටයුත්තක දී වගකීම පිළිබඳ භාවිතය පෙන්නුම් කරයි.
13. සන්නිවේදන වර්ග හා ස්වරූප පිළිබඳ අවබෝධය ප්‍රකට කරයි.
14. දේශීය රූපවාහිනී ඉතිහාසය පිළිබඳ දැනුම ආවර්ජනය කරයි.
15. අන්තර්ජාල පහසුකම් පිළිබඳ භාවිතය විග්‍රහ කරයි.
16. ගුවන්විදුලි නාලිකාවල තරංග සම්ප්‍රේෂණය පිළිබඳ අවබෝධය පෙන්නුම් කරයි.
17. පුවෘත්ති හා වාර්ගිකත්වය පිළිබඳ විවිධතා අවබෝධයට ලක් කරයි.
18. මාධ්‍ය භාවිතය පිළිබඳව ඇති භාවිතය විමසයි.
19. අත්සන හා නිලමුද්‍රාව භාවිතය විමර්ශනය කරයි.
20. සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය ප්‍රකට කරයි.
21. ප්‍රවෘත්තියක ගුණාංග පිළිබඳව ඇගයීමට ලක් කරයි.
22. පුවත් පත් ප්‍රකාශනයේ පියවර පිළිබඳ භාවිතය ගෙන හැර දක්වයි.
23. රාජ්‍ය මාධ්‍ය භාවිතය පැහැදිලි කරයි.
24. දෘෂ්ටියේ අඛණ්ඩතා සිද්ධාන්තය පිළිබඳ අවබෝධය පෙන්නුම් කරයි.
25. ගුවන් විදුලි මාධ්‍ය වැඩසටහන් පිළිබඳ භාවිතය ගෙන හැර දක්වයි.
26. මාධ්‍ය හා ග්‍රාහකයා අතර සම්බන්ධය ඇගයීමට ලක්කරයි.
27. යටිකුරු පිරමීඩාකාර වාර්තාකරණය පිළිබඳ භාවිතය ගෙන හැර දක්වයි.
28. රූපවාහිනී රියැලටි වැඩසටහනක භාවිත ලක්ෂණ පැහැදිලි කරයි.
29. ශ්‍රව්‍ය ප්‍රකාශන විධි භාවිතය ගෙන හැර දක්වයි.
30. ඡායාරූපකරණය පිළිබඳ අවබෝධය ප්‍රකට කරයි.
31. තොරතුරු සන්නිවේදනයකට පුද්ගලයකු සතු අවබෝධය ගෙන හැර දක්වයි.
32. මුද්‍රණ ක්‍රමවල භාවිතය ගෙන හැර දක්වයි.
33. දෘශ්‍ය සංඥා විද්‍යුත් ක්‍රමවේදය ඔස්සේ ප්‍රතිනිර්මාණය පිළිබඳ භාවිතය හඳුනා ගනී.
34. ඩිජිටල් ඡායාරූපකරණය පිළිබඳ භාවිත ස්වභාවය හඳුනා ගනී.
35. සාම්ප්‍රදායික සන්නිවේදනයේ භාවිතය පිළිබඳ ප්‍රකට කරයි.
36. පරිගණකයක් භාවිතයෙන් තොරතුරු ඉදිරිපත් කරන යන්ත්‍ර පිළිබඳ භාවිත දැනුම දක්වයි.
37. ග්‍රාහකයින්ගේ ස්වභාවය පිළිබඳ ඇගයීමක් ලබාදෙයි.
38. අන්තර්ජාලයේ පලකරන පුවත්පත් අයත් මාධ්‍ය පිළිබඳ භාවිතය ඇගයීමක යෙදේ.
39. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා පුරවැසි හිමිකම පිළිබඳ භාවිතය පිළිබඳ ඇගයීමක යෙදෙයි.
40. සන්නිවේදන ස්වරූපය පිළිබඳ විශ්ලේෂණාත්මක අවබෝධය ගෙන හැර දක්වයි.

CamScanner

රහස්‍යයි

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025(2026)
## க.பொ.த. (சா.தர)ப் பரீட்சை – 2025(2026)
### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

විෂය අංකය / பாட இலக்கம்: 87   විෂයය / பாடம்: සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

| ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 3 | 21. | 1 | 31. | 4 |
| 02. | 4 | 12. | 3 | 22. | 3 | 32. | 2 |
| 03. | 3 | 13. | 1 | 23. | 4 | 33. | 3 |
| 04. | 4 | 14. | 1 | 24. | 4 | 34. | 4 |
| 05. | 2 | 15. | 2 | 25. | 3 | 35. | 3 |
| 06. | 1 | 16. | 1 | 26. | 4 | 36. | 1 |
| 07. | 3 | 17. | 2 | 27. | 2 | 37. | 3 |
| 08. | 4 | 18. | 1 | 28. | 3 | 38. | 2 |
| 09. | 2 | 19. | 2 | 29. | 2 | 39. | 4 |
| 10. | 4 | 20. | 4 | 30. | 3 | 40. | 1 |

PAST PAPERS WIKI

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர் வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| | | | |
|---|---|---|---|
| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව | 25 | I පත්‍රයේ මුළු ලකුණු | 25 |
| சரியான விடைகளின் தொகை | 40 | பத்திரம் I இன் மொத்தப்புள்ளி | 40 |



CS CamScanner

Past Papers Wiki



# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## II පත්‍රය

**ප්‍රශ්න අංක 01**

**1.** දඩයම් යුගයේ සිටි ප්‍රාථමික මානවයා ක්‍රම ක්‍රමයෙන් විශ්ව මිනිසකු බවට පරිවර්තනය වීමේ දී සන්නිවේදනය ප්‍රබල සාධකයක් විය.

(i) සාම්ප්‍රදායික දෘශ්‍ය සන්නිවේදන ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

- ගින්දර
- දුම
- ගස්වල එල්ලූ කොළ අතු
- චිත්‍ර
- ගස්වල කැපූ කට්ටා
- කොඩි/ ධජ
- ශෛලමය සලකුණු (කතිර/ ඊතල)

(ලකුණු 02)

(ii) අන්තර් පුද්ගල සන්නිවේදනයේ විශේෂතා **දෙකක්** ලියන්න.

- අන්තර් පුද්ගල සන්නිවේදනය පුද්ගලයන් දෙදෙනෙකු හෝ කිහිප දෙනෙකු අතර සිදු වන බව.
- මුහුණට මුහුණ ලා සිදු කෙරෙන සන්නිවේදනයක් ලෙස මෙන්ම දුරකථනය වැනි සන්නිවේදන උපකරණ භාවිතයෙන් ද සන්නිවේදනය සිදු වන බව
- සන්නිවේදකයාට හා ග්‍රාහකයාට එකිනෙකා අවබෝධ කර ගනිමින් සන්නිවේදන කාර්යයෙහි නිරත විය හැකි බව
- සමීපව සිදුවන සන්නිවේදනයක් නිසා එකිනෙකා අතර වඩාත් ක්‍රියාකාරී සම්බන්ධතාවක් ඇති වීම
- විවිධ සන්නිවේදන විධික්‍රම භාවිත කළ හැකි වීම.
- සන්නිවේදකයාගේ අරමුණ මෙන්ම ග්‍රාහකයාගේ ප්‍රතිචාර ද ඒ අවස්ථාවේදීම හඳුනාගත හැකි වන නිසා, සන්නිවේදන කාර්යයේ ඵලදායකත්වය ඉහළ යාම.
- ඍජු ප්‍රතිචාර හා ප්‍රතිපෝෂණය ලබාගත හැකි නිසා අඛණ්ඩවන සන්නිවේදන කාර්ය පවත්වා ගෙන යා හැකි වීම.
- අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී ප්‍රමුඛව යොදා ගැනෙන වාචික සන්නිවේදනය සමග අවාචික සන්නිවේදනය ද සම්බන්ධ වීම.
- අදහස් ප්‍රකාශන හැකියාව, එම අදහස් නිසි ලෙස තේරුම් ගැනීම හෙවත් සංජානනයේ හැකියාව මත අන්තර් පුද්ගල සන්නිවේදනයේ සාර්ථක අසාර්ථකභාවය තීරණය වීම.
- අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී භාවාත්මක හැඟීම් ප්‍රකාශ කිරීම වඩාත් සක්‍රිය වීම.
- යමක් විස්තර කරමින් හා අවධාරණය කරමින් නැවත නැවත අදහස් හුවමාරු කරගැනීමට හැකි වීම.
- අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී තමන් වෙත ලැබෙන සන්දේශ වඩාත් පැහැදිලි කරගැනීමේ හා විමසා බැලීමේ පුළුල් අවකාශයක් පැවතීම.

(ලකුණු 02)

CS CamScanner

(iii) භාෂාවේ මූලික කාර්ය **දෙකක්** සඳහන් කරන්න.

- සිතීම විධිමත් කිරීම
- සැබෑව හඳුනා ගැනීම
- දැනුම සංරක්ෂණය
- පැවැත්ම පිළිබඳ සාධක ඉදිරියට ගෙන යාම
- වාචික ප්‍රකාශනය
- කාලය සන්නිවේදනය

(ලකුණු 02)

(iv) සාම්ප්‍රදායික සමාජයේ ජීවත් වූ මිනිසා භාවිත කළ ශබ්ද මාධ්‍ය **දෙකක්** නම් කරන්න.

- හූව
- සංඥා හඬ
- බෙර හඬ
- සත්ත්ව නාද
- ස්වාභාවික නාද
- ශරීර අංග ඇසුරෙන් නිර්මාණය කරගත් ශබ්ද
- උපකරණ ආශ්‍රිතව නිර්මාණය කරගත් ශබ්ද (හොරනෑව/ හක් ගෙඩිය)

(ලකුණු 02)

(v) පුවත්පත් පළ කෙරෙන වාරය අනුව වර්ග කරනු ලබන ආකාර **දෙකක්** සඳහන් කරන්න.

- දිනපතා උදෑසන
- දිනපතා සවස
- සති අන්ත
- සතිපතා හෝ සති මැද
- දෙසති
- මාසික
- වාර්ෂික
- ද්වි මාසික
- කාර්තු/ ත්‍රෛ මාසික
- ද්වි වාර්ෂික

(ලකුණු 02)

(vi) ගුවන්විදුලි මාධ්‍යයේ දුබලතා **දෙකක්** දක්වන්න.

- ගුවන්විදුලිය හුදෙක් ශබ්දය පමණක් පාදක වූ මධ්‍යයක් වීම
- ගුවන්විදුලි වැඩසටහනක් කනට ඇසෙන්නේ එක් වරක් පමණක් වීම (ශ්‍රවණ භංගුර)
- අසන්නාගේ අවධානය ගුවන්විදුලි වැඩසටහනින් ඉවතට යොමු වීමට ඇති ඉඩකඩ වැඩිවීම
- ගැඹුරු සංකීර්ණ අදහස් ග්‍රාහක ගත කිරීමේ අපහසුව (සංඛ්‍යා/ ලැයිස්තු ආදී)

(ලකුණු 02)



CS CamScanner

**(vii)** ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක රාජ්‍ය රූපවාහිනී ආයතන **දෙක** නම් කරන්න.

- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (ජාතික රූපවාහිනිය/ SLRC)
- ස්වාධීන රූපවාහිනී සේවය (ITN)

**(viii)** නව මාධ්‍ය ස්වභාවයට අදාළ කරුණු **දෙකක්** සඳහන් කරන්න.

- භූගෝලීය වශයෙන් සීමා නොවීම
- ග්‍රාහකයාට අභිමත පරිදි සන්දේශ තෝරා ගැනීමට හැකි වීම
- පරිගණකය, ජංගම දුරකථන වැනි බහු කාර්ය උපකරණ ආශ්‍රිතව භාවිත කිරීමට හැකි වීම
- ඕනෑම අවස්ථාවක, ඕනෑම ස්ථානයක සිට භාවිත කළ හැකි වීම
- ගෝලීය වශයෙන් ව්‍යාප්තිය සිදු වීම
- සම්බන්ධ වන සියලුදෙනාටම අන්තර් ක්‍රියාකාරී ලෙස තොරතුරු හුවමාරු කරගැනීමට හා නිර්මාණ සංස්කරණය කිරීමට ඇති හැකියාව
- වේගවත්ම තොරතුරු හුවමාරු කරගත හැකි වීම
- සජීවී ව තොරතුරු හුවමාරු වීම
- අභිසාරී මාධ්‍යයක් ලෙස භාවිත කිරීමේ හැකියාව

(ලකුණු 02)

**(ix)** පරිගණකය භාවිතයේ දී ඔබ අනුගමනය කරන ආචාරධර්ම **දෙකක්** සඳහන් කරන්න.

- අන් අයට හානිදායක ලෙස පරිගණකය භාවිතයෙන් වැළකීම
- අන් අයගේ පරිගණක දත්ත, ලිපි ගොනු ආදිය පරිහරණය කිරීමෙන් වැළකීම
- වංචනික කටයුතු සඳහා පරිගණකය යොදා නොගැනීම
- අනවසර මෘදුකාංග භාවිතයෙන් වැළකීම
- තමාට පරිබාහිර පරිගණක ජාලයන්ට අනවසරයෙන් ඇතුළුවීමෙන් වැළකීම
- සදාචාර විරෝධී හා නීති විරෝධී ක්‍රියා සඳහා පරිගණකය භාවිත නොකිරීම
- පරිගණක ක්‍රීඩා අන්තර්ජාලය හා සමාජ ජාලා වෙබ් අඩවි ආදියට ඇබ්බැහිවීමෙන් ඇති වන අහිතකර තත්ත්වයෙන් අත් මිදීම
- මානසික අසමබරතාවට හානි වන ලෙස පරිගණකය භාවිත නොකිරීම

(ලකුණු 02)

**(x)** තොරතුරු හුවමාරු කරගැනීමේ දී ඔබ භාවිතයට ගන්නා සමාජ මාධ්‍ය ජාල **දෙකක්** නම් කරන්න.

- Facebook/ Messenger
- Twitter/ X
- WhatsApp
- Linkedin
- Printerest
- Viber
- Telegram
- WeChat
- Imo

(ලකුණු 02)

(මුළු ලකුණු 02 x 10 = 20)

CS CamScanner

| 2. | (i) පුවත්පත් මාධ්‍යය තුළ ග්‍රාහකයා හඳුන්වන නාමය කුමක් ද? |
|---|---|

පාඨකයා

(ලකුණු 01)

| (ii) නිෂ්ක්‍රීය ග්‍රාහකයා පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. |
|---|

- මාධ්‍යයෙන් එන සන්දේශ කිසිදු විචාරයකින් තොරව භාර ගැනීමට සූදානමින් සිටින්නේ නිෂ්ක්‍රීය ග්‍රාහකයා ය.
- මාධ්‍ය හා ව්‍යාපාරික අනුග්‍රාහකත්වය විසින් තමාට අවශ්‍ය කරන සමාජ මතය ගොඩනැගීම සඳහා බොහෝ විට මෙම ග්‍රාහක කණ්ඩායම යොදා ගනු ලබයි.
- මෙම පිරිස මාධ්‍ය සමඟ නිතර සම්බන්ධතා පවත්වයි.
- නිෂ්ක්‍රීය ග්‍රාහකයා මාධ්‍ය කෙරෙහි වැඩි විශ්වාසයක් තබයි.
- විද්‍යුත් මාධ්‍යයට නිතර දුරකථන ඇමතුම් ලබා ගනිමින් ඉල්ලීම් කරන්නේත්, කෙටි පණිවිඩ, තැපැල් පත් ආදිය මගින් වැඩසටහන් හා මාධ්‍යකරුවන් අර්ථවිරහිත ඇගයීම් කිරීමට ඉදිරිපත් වන්නේත් මෙකී නිෂ්ක්‍රීය ග්‍රාහක පිරිසයි.
- ප්‍රතිචාර නොදැක්වුව ද මාධ්‍යයෙන් ගෙන එන වැඩසටහන්, ලිපි හෝ නොයෙක් සන්දේශවලට අනුව තම දෛනික කටයුතු හැඩගස්වා ගැනීම නිෂ්ක්‍රීය ග්‍රාහකයින්ගේ ස්වභාවයයි.

(ලකුණු 02)

| (iii) පුවත්පත් අන්තර්ගතය පිළිබඳ පහත සඳහන් ආකෘති විස්තර කරන්න.<br>(අ) ප්‍රවෘත්ති<br>(ආ) විශේෂාංග ලිපි<br>(ඉ) වෙළෙඳ දැන්වීම් |
|---|

(අ) ප්‍රවෘත්ති

- කාලීන වුත්, නැවුම් වුත්, කැපී පෙනෙන්නාවුත්, පොදු ජනතාවට අදාළ හා සමීප, බලපෑම් කළ හැකි තොරතුරු ප්‍රවෘත්ති වේ.
- යටිකුරු පිරමීඩ ආකෘතියට අනුව ඉදිරිපත් කරනු ලබයි.
- සමාජ, දේශපාලන, ආර්ථික හා ගවේෂණාත්මක යනාදී විවිධ ක්ෂේත්‍ර ඔස්සේ සකස් කළ ප්‍රවෘත්ති ආකෘති පවතී.
- පුවත්පත තුළ පළවන බොහෝ ලිපි ප්‍රවෘත්තිමය වටිනාකමකින් යුතුය.
- පුවත්පතක ප්‍රමුඛතම ප්‍රවෘත්තිය ප්‍රධාන සිරස්තලය යටතේ පළ වේ.
- පළමු පිටුවේ කැපී පෙනෙන ස්ථානයක සිරස්තලය (ලීඩ් නිව්ස්) පළ කෙරේ.
- පුවත්පතක විවිධ ප්‍රවෘත්ති විවිධ සිරස්තල යටතේ පුවත්පතේ විවිධ පිටුවල පළ වේ.

(ආ) විශේෂාංග ලිපි

- විශේෂාංගයක් යනු ග්‍රාහකයාට විවේකීව කියවා රස විඳිය හැකි ගුණාංගවලින් යුතු නිර්මාණයකි.
- සංවාද, දෙබස්, කවි පන්ති, උධෘත පාඨ, වර්ණනා, විචාරයන්, යෝජනා ආදි ආකෘතීන් පවතී.
- අසාමාන්‍ය හා විශේෂ තොරතුරු ග්‍රහණය කිරීමේ හැකියාව රචකයා තුළ තිබිය යුතුය.
- නිර්මාණශීලී ආකෘති යොදා ගත යුතුය.
- විශේෂාංග ලිපි රචකයා විසින් භාෂා භාවිතය මනා සංයමයකින් යුතුව ආකර්ෂණීය ලෙසින් සිදු කළ යුතුය.

(ඉ) වෙළෙඳ දැන්වීම්

- පුවත්පත් ආයතන විසින් ලාභ ලැබීමේ අරමුණින් වෙළෙඳ දැන්වීම් පළ කරනු ලබයි.
- පුවත්පත් ආයතනයක සේවක පඩිනඩි, දෛනික පිරිවැය, අලුත්වැඩියා හා නඩත්තු වැනි බොහෝ වියදම් පියවනු ලබන්නේ වෙළෙඳ දැන්වීම් මඟින් උපයා ගනු ලබන ආදායමෙනි.
- බොහෝ පුවත්පත් වාණිජ අරමුණු ප්‍රමුඛ කර ගනිමින් වෙළෙඳ දැන්වීම් සඳහා වැඩි ඉඩක් ලබා දෙයි.
- මෙහි දී අනෙකුත් අන්තර්ගත ආකෘති සාරාංශ කිරීමට, අඩු කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කරයි.
- පුවත්පත් අන්තර්ගතයේ ගුණාත්මකභාවයට බලපෑම් ඇති කරයි.

(ලකුණු 03)

(iv) ජන සන්නිවේදනයේ ස්වභාවය ප්‍රධාන කරුණු **හතරක්** යටතේ පැහැදිලි කරන්න.

- ජනමාධ්‍ය භාවිතයෙන් සන්නිවේදනය සිදු කරයි.
- සන්දේශය පොදු වේ.
- අඛණ්ඩ ක්‍රියාවලියකි.
- සන්නිවේදකයා හා ග්‍රාහකයා අභිමුඛ නොවේ.
- සැලසුම් සහගත ක්‍රියාවලියකි.
- සංවිධිත ආයතනයක් මඟින් ක්‍රියාත්මක වේ.
- ග්‍රාහක පද්ධතිය ඉතා විශාල හා පැතිරුණු ස්වභාවයක් ගනී.
- වෘත්තීය සන්නිවේදකයෝ කටයුතු කරති.
- මූලික වශයෙන් ඒකමාර්ගිකව සිදු වේ.
- බහුවිධ දොරටුපාලකයින් දක්නට ලැබේ.
- තාක්ෂණික උපකරණ භාවිතයට ගනියි.
- සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර ඇත්තේ දූරස්ථ සම්බන්ධතාවකි.
- සාපේක්ෂව ග්‍රාහක ප්‍රතිචාර ප්‍රමාද වේ.
- ජනමාධ්‍ය සන්නිවේදනය සාමූහික කාර්ය පද්ධතියකි.

( ඉහත කරුණු හතරක් විස්තර කර තිබිය යුතුය.)

(ලකුණු 04)



CamScanner

3. ස්වාභාවික ව්‍යසන අවස්ථාවක දී ප්‍රවාහන, විදුලිබලය හා දුරකථන සේවා අඩාල වීමෙන් තොරතුරු දැනගැනීමට නොහැකිව ඇතැම් ග්‍රාමීය ප්‍රදේශ හුදෙකලා බවට පත් විය හැකි ය.

(i) ව්‍යසන අවස්ථාවක දී ඉක්මනින් තොරතුරු දැන ගත හැකි ප්‍රධාන ජනමාධ්‍යය කුමක් ද?

ගුවන්විදුලිය/ රේඩියෝව

**(ලකුණු 01)**

(ii) තොරතුරු දැනගැනීමේ සමාජීය අවශ්‍යතාවට අදාළ කරුණු **දෙකක්** ලියන්න.

- රාජ්‍ය ආයතනවල කටයුතු පවත්වා ගැනීම.
- පෞද්ගලික ව්‍යාපාර හා වෙනත් ආයතන පවත්වාගෙන යාම.
- සමාජ සුභසාධන සංවිධානවල කටයුතු සඳහා
- විවිධ දේශපාලනික සංවිධානවල කාර්යයන් සඳහා
- විවිධ ජන කොටස්වල සංස්කෘතික වටිනාකම් පවත්වාගෙන යාමට
- විවිධ ආගමික කණ්ඩායම්වල කටයුතු පවත්වාගෙන යාමට
- සියලු ආයතන, සංවිධාන, සමාජ කණ්ඩායම් හා රජය අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා
- විශේෂ අවශ්‍යතා අනුව ජනතාවට තොරතුරු, උපදෙස්, මාගෝපදේශ හා අනතුරු ඇඟවීම් පිළිබඳ සන්නිවේදනය කිරීම සඳහා

**(ලකුණු 02)**

(iii) ජනමාධ්‍ය මගින් සමාජය වෙත සිදු කරනු ලබන බලපෑම් **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

- දෛනික ජීවිතය වෙනස් කිරීම + −
- පරිභෝජන රටාව වෙනස් කිරීම + −
- රස වින්දනය වෙනස් කිරීම + −
- විවිධ චිත්තාවේග ඇති කිරීම හා වැඩි දියුණු කිරීම + −
- විවිධ චර්යා ඇති කිරීමට පෙළඹවීම + −
- විවිධ යෝග්‍ය මෙන්ම අයෝග්‍ය පුරුදු ඇති කිරීම + −
- සමාජීය ගැටලු තේරුම් ගැනීමට මග පෑදීම +
- ජීවන ගැටලුවලට යෝග්‍ය මෙන්ම අයෝග්‍ය තීරණ ගැනීමට ඉගැන්වීම + −
- අන්‍යෝන්‍ය සම්බන්ධතා ගොඩනැගීම හා බිඳ වැටීම + −
- විවිධ සමාජාර්ථ පුද්ගලයන් තුළ ගොඩනැංවීම +
- සාම්ප්‍රදායික භාෂාව වෙනස් කිරීමට හේතු වීම + −
- මාධ්‍ය වැඩසටහන්වලින් නිරූපණය කරන චරිත ළමුන්ගේ වීරයන් බවට පත් වීම −
- සමාජ සංස්කෘතියට නොගැළපෙන විලාසිතාවලට යොමු වීම −
- ඵලදායී නොවන හුරු පුරුදුවලට යොමු වීම නිසා තම කාලය හා ධනය නිකරුණේ වැය වීම. −
- මාධ්‍ය මගින් උසස් කොට සලකන නමුත් තමාට ඉටුකරගත නොහැකි ඵලදායී නොවන අපේක්ෂාවන් පසු පස හඹා යාම නිසා ජීවිතය අසාර්ථකත්වයට පත් වීම. −

**(ලකුණු 03)**



CS CamScanner

(iv) තොරතුරු රැස්කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** විස්තර කරන්න.

- පෞද්ගලිකත්වයට හානි කරන හෝ හෙළි කිරීමට අකමැති තොරතුරු ඉල්ලා නොසිටිය යුතුය.
- තොරතුරු ලබා දෙන පුද්ගලයා හෙවත් දත්ත දායකයා අපහසුතාවට පත් නොකළ යුතුය.
- ලබා ගැනීමට අවශ්‍ය තොරතුරු පමණක් විමසිය යුතුය.
- තොරතුරු රැස් කිරීමේ දී තොරතුරු උපුටා ගත් මූලාශ්‍රය නිවැරදිව දැක්විය යුතුය.
- ඇතැම් තොරතුරුවල රහස්‍යභාවය සුරැකීම.
- සදාචාරයට හානිවන තොරතුරු රැස් කිරීමෙන් වැළකිය යුතුය.
- සෑම පුද්ගලයෙකුගේම කීර්තිනාමයට ගරු කරමින් අනවශ්‍ය පෙළඹවීම්වලින් තොරව තොරතුරු ලබා ගත යුතුය.
- ජාති භේද, ආගම් භේද ඉස්මතු කරවන තොරතුරු ලබා ගැනීමෙන් වැළකිය යුතුය.
- පෞද්ගලික වාසි අපේක්ෂාවෙන් තොරතුරු රැස් නොකළ යුතුය.
- වාර්තාකරුවාගේ මතය තහවුරු කරගැනීම සඳහා තොරතුරු ලබා ගැනීමෙන් වැළකී සිටිය යුතුය.

**(කරුණු හතරක් නිවැරදිව විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.)**

**(ලකුණු 04)**

4. "මාධ්‍ය සමාජයට මඟ පෙන්වයි" යන්න මෙවර පාසල් මාධ්‍ය උළෙලේ තේමා පාඨයයි.

(i) වර්තමානයේ විකාශය වන රූපවාහිනී ටෙලිනාට්‍ය බොහෝමයක කතා තේමාව ගොනු වී ඇත්තේ කුමන සමාජ සංස්ථාව වටා ද?

පවුල

(ලකුණු 01)

(ii) බුද්ධිමය දේපළ පනතේ 'කෘතිය' ලෙස හඳුන්වන නිර්මාණ වර්ග **දෙකක්** නම් කරන්න.

- පොත්, පත්‍රිකා, ලිපි, පරිගණක වැඩසටහන් හා වෙනත් ලියකියවිලි
- කථා, දේශන, ඇමතීම්, අනුශාසනා සහ වෙනත් වාචික කෘති
- නාටකීය හෝ ගීත නාටකීය කෘති, අභිරූපණ නෘත්‍ය, විද්‍යාත්මක කෘති සහ වේදිකා සඳහා වන නිෂ්පාදන වශයෙන් නිෂ්පාදිත වෙනත් කෘති
- ඡේදයේ නිශ්චිතව සඳහන් කෘති වේදිකා ගත කිරීම සඳහා නිෂ්පාදනය කිරීම සහ එවැනි නිෂ්පාදන සඳහා යෝග්‍ය ජනප්‍රවාද, ප්‍රකාශන වේදිකා ගත කිරීම සඳහා නිෂ්පාදනය කිරීම
- සාහිත්‍ය සමග ගයන වචන ඇතුළත් හෝ නොවන සංගීතමය කෘති
- ශ්‍රව්‍ය දෘශ්‍ය කෘති
- ගෘහ නිර්මාණ ශිල්පීය කෘති
- චිත්‍ර පින්තාරු කිරීම, මූර්ති, කැටයම්, ලිතෝ මුද්‍රණ, විචිත්‍ර ගෙත්තම් සහ වෙනත් ලලිත කලාත්මක කෘති
- ඡායාරූප ශිල්පීය කෘති
- ව්‍යවහාරික කලා කෘති
- භූගෝල විද්‍යාව හා භූ ලක්ෂණ විද්‍යාව හෝ විද්‍යාව හා සම්බන්ධ සිතියම්, පිඹුරුකටු සටහන් සහ ත්‍රිමාණ කෘති

(ලකුණු 02)

(iii) විද්‍යුත් පුවත්පතක ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

- ක්ෂණිකව පුවත් දැනගැනීමේ හැකියාව
- ගබඩා කර තබා ගැනීමේ පහසුව
- උපුටා ගැනීම්, පිටපත් කිරීම් හා නැවත බෙදා හැරීමේ පහසුව
- නැවත නැවත කියවිය හැකිවීම
- තොරතුරු විෂයයන් අනුව වර්ග කරමින් පළ කර තිබීම
- ක්ෂණික පාඨක ප්‍රතිචාර ලැබීම
- අදාළ වෙනත් මූලාශ්‍ර සමග සබැඳීමේ හැකියාව (Hyperlink)
- [illegible]
- ඕනෑම ස්ථානයක සිට කියවිය හැකිවීම.

(ලකුණු 03)

(කරුණු 03 ම නිවැරදිව නම් කර ඇත්නම් ලකුණු එකක් පමණක් ප්‍රදානය කරන්න.)

(iv) ජනසන්නිවේදනයේ පහත කාර්ය **දෙක** සාකච්ඡා කරන්න.

(අ) පෙළඹවීම

(ආ) විනෝදාස්වාදය

**පෙළඹවීම -**

- පෙළඹවීම යන්න ජනසන්නිවේදනයේ ප්‍රධාන කාර්යකි.
- පෙළඹවීම හා සන්නිවේදනය අතර ඇත්තේ ප්‍රබල සම්බන්ධතාවක් වීම.
- ජනමාධ්‍ය මගින් ලැබෙන පෙළඹවීම ආකල්පමය හා චර්යාත්මක වශයෙන් සිදුවීම.
- පෙළඹවීම් කාර්යයේ දී ඇතැම් විට පිරිවැයක් දැරීමට සිදු වීම.

**විනෝදාස්වාදය -**

- විනෝදාස්වාදය යන්න ජනසන්නිවේදනයේ ප්‍රධාන කාර්යයක් බව.
- පුද්ගලයාගේ මානසිකත්වය යහපත්ව පවත්වා ගැනීම සඳහා ප්‍රබෝධයක් ඇති කළ හැකි වීම.
- විනෝදාත්මක කාර්ය සඳහා ඇතැම් විට යම් පිරිවැයක් දැරීමට සිදු වීම.
- සංවිධානාත්මක විනෝදාස්වාදයක් ලබාදීම ජනමාධ්‍යය මගින් සිදු කිරීම
  උදා: ටෙලි නාට්‍ය, සංගීත සංදර්ශන වැඩසටහන්
- විශ්‍රාන්තිය, මානසික ඉහිල් බව, ආතතිය දුරලීම ආදිය සිදු වීම

(ලකුණු 04)

PAST PAPERS WIKI

5. දකුණු ආසියානු ජ්‍යෙෂ්ඨ මලල ක්‍රීඩා තරගාවලිය ඉන්දියාවේ දී අවසන් වූයේ ශ්‍රී ලාංකික ක්‍රීඩා ලෝලීන් අමන්දානන්දයට පත් කරමිනි. ජනමාධ්‍ය සහ නව මාධ්‍ය ඔස්සේ සජීව ලෙස එහි සුවිශේෂ අවස්ථා දැකගැනීමට අපට හැකි විය.

(i) රූපවාහිනී මාධ්‍ය අයත් වන්නේ කුමන සන්නිවේදන වර්ගයකට ද?

ජනසන්නිවේදනය

(ලකුණු 01)

(ii) මාධ්‍ය අභිසාරිතාවෙහි ප්‍රතිලාභ **දෙකක්** ලියන්න.

- විවිධ පාඨකයන්ට ප්‍රවේශ වීමට හැකි වීම
- තොරතුරු ආකර්ෂණීයව ලබා ගත හැකි වීම
- කාලය, ශ්‍රමය හා මුදල් ඉතිරි වීම
- විවිධාංගීකරණය වූ අන්තර්ගතයන්ට ප්‍රවේශ වීමේ හැකියාව
- ග්‍රාහකයා ක්‍රියාකාරී පරිශීලකයෙක් බවට පත් වීම
- තනි මෙවලමක් ආධාරයෙන් බහුමාධ්‍ය වෙත ප්‍රවේශ වීමේ හැකියාව
- එසැනින් යාවත්කාලීන තොරතුරු වෙත ප්‍රවේශ වීමේ හැකියාව
- ඉක්මනින් තොරතුරු රැස් කිරීම, සංස්කරණය කිරීම, ඉදිරිපත් කිරීමේ හැකියාව

(ලකුණු 02)

(iii) ඉහත සිද්ධියට අදාළව රූපවාහිනී මාධ්‍යයේ පහත ලක්ෂණවල වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න.

(අ) ශ්‍රව්‍ය - දෘශ්‍ය බව

(ආ) සමීප බව

(ඉ) සජීව බව

(අ) ශ්‍රව්‍ය දෘශ්‍ය බව -

- රූපවාහිනී මාධ්‍ය ප්‍රබල ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් බැවින් තරගයේ ආරම්භක අවස්ථා, ආරම්භක චලනයන් පෙන්විය හැකිය.
- විචිත්‍ර වර්ණ හා හඬ යොදා ගත හැකි නිසා ප්‍රේක්ෂක ප්‍රතිචාර, ඔවුන්ගේ හැසිරීම් දැක ගත හැකිය. සියලුම අවස්ථාවන් ඇසීමට හා දැකීමට හැකි නිසා ආකර්ෂණීය වේ.

(ආ) සමීප බව -

- ඉන්දියාවේ පවත්වන ක්‍රීඩා අවස්ථාවක් වුව ද සිය ආලින්දයේ සිට සමීපව නැරඹිය හැකිය.
- එම ස්ථානයට නොයා නිවසේ සිටම ක්‍රීඩක ඉරියව්, ක්‍රීඩා අවස්ථාවන් හොඳින් නිරීක්ෂණය කළ හැකිය.
- සිය දෛනික ජීවිතය ක්‍රීඩා උත්සවයේ කාලසටහනට අනුව වෙනස් කර ගනිමින් කටයුතු කළ හැකිය.
- ක්‍රීඩා තරගය නැරඹීම සඳහා ගුවන් ටිකට්පත් මිලදී ගැනීමට හෝ ඒ සඳහා ගමන් වියදම් දැරීමට අවශ්‍ය සිදු නොවීම.

(ඉ) සජීව බව -

- ඉහත ක්‍රීඩා උත්සවය පවත්වන ස්ථානයේ තත්ත්වය, ක්‍රීඩා ලෝලීන්ගේ ප්‍රතිචාර දැකගත හැකිය.
- තරගයේ ආරම්භක අවස්ථාවන්, ක්‍රීඩකයන්ගේ සුවිශේෂ දක්ෂතා මෙන්ම දුබලතා නැරඹිය හැකිය.

(ලකුණු 03)

(සිද්ධියට අදාළව කරුණු විස්තර කර තිබිය යුතුය.)



CamScanner

(iv) ඉහත තරඟාවලිය රූපවාහිනිය ඔස්සේ වාර්තා කිරීමේ දී පහත වැඩසටහන් ප්‍රභේද දෙක යොදා ගත හැකි ආකාරය වෙන වෙනම විස්තර කරන්න.

(අ) ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන්

(ආ) වාර්තා වැඩසටහන්

ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් -

- සජීවී වැඩසටහන්, එසැන පුවත් හා පටිගත කිරීම් ලෙස ඉදිරිපත් කළ හැකිය.
- සම්මුඛ සාකච්ඡා, ගවේෂණාත්මක, විවේචන, විශ්ලේෂණ, විමර්ශනාත්මක ලෙස ඉදිරිපත් කළ හැකිය.
- ක්‍රීඩා උළෙලේ උණුසුම් අවස්ථාවන්, ප්‍රේක්ෂකයන් වෙත ලබා දිය හැකිය.
- ජයග්‍රහණ, වාර්තා පිහිටුවීම හා බිඳවැටීම, සමාරම්භය, තරඟයේ ආරම්භය සහ අවසානය, විශේෂ අවස්ථා පිළිබඳ ප්‍රවෘත්ති ඉදිරිපත් කළ හැකිය.

වාර්තාමය වැඩසටහන් -

- චරිතාපදාන, ක්‍රීඩකයන්ගේ අසාධාරණයන්ට පත් වූ අවස්ථා, දූෂිත අවස්ථා ලෙස ඉදිරිපත් කළ හැකිය.
- දීර්ඝකාලීනව තොරතුරු රැස්කිරීම තුළින් ගවේෂණාත්මකව ඉදිරිපත් කිරීමට හැකිය.
- ජයග්‍රාහී ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිළිබඳ වැඩසටහන් කෙටි චිත්‍රපට ලෙස ඉදිරිපත් කළ හැකිය.
- ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ චරිතාපදානයන්, පවුල් පසුබිම, ආර්ථික තත්ත්වයන් පිළිබඳ වැඩසටහන් කළ හැකිය.
- තරඟ පෙර පුහුණුවීම් අවස්ථා, සුවිශේෂී අවස්ථා මෙන්ම ජයග්‍රහණයන් ප්‍රේක්ෂකයන් වෙත ලබා දිය හැකිය.

(ලකුණු 04)

[illegible]

6. සාශා විසින් මාෂාට කියන ලද තොරතුරක් පසුව ලැව්ගින්නක් සේ පැතිර ගියේ ය.

(i) ඉහත ආකාරයෙන් තොරතුර පැතිර යාමට අදාළ අවිධිමත් සන්නිවේදන ආකෘතිය කුමක් ද?

ඕපාදූප දාමය

(ලකුණු 01)

(ii) එකිනෙකා අතර තොරතුරු හුවමාරු කර ගැනීමේ දී භාවිත කළ හැකි මාධ්‍ය උපකරණ **දෙකක්** නම් කරන්න.

- දූරකථනය (ජංගම දූරකථනය, සුහුරු ජංගම දූරකථනය, ස්ථාවර දූරකථනය)
- ෆැක්ස් යන්ත්‍රය
- අන්තර්ජාලය හා සබැඳි පරිගණකය
- පරිගණක ජාල
- වෝකිටෝකි

(ලකුණු 02)

(iii) අවිධිමත් සන්නිවේදනයේ ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

- වේගයෙන් පැතිර යාම
- අවිධිමත් සන්නිවේදනය සඳහා බලධාරියෙකු නොමැති වීම
- ආරම්භක ස්ථානය පැහැදිලි නොවීම
- මුලින් නිකුත් වන තොරතුරට වඩා විකෘති තොරතුරක් ලැබිය හැකි වීම.
- සන්දේශයට වග කියන්නෙකු හඳුනාගත නොහැකි වීම.
- විධිමත් සන්නිවේදනයෙන් වාර්තා නොවන අවස්ථා හා සිදුවීම්වල දී අවිධිමත් සන්නිවේදනය සක්‍රියව ක්‍රියාත්මක වීම
- විවිධ අවිධිමත් සන්නිවේදන ආකෘති පැවතීම

(ලකුණු 03)

(iv) ගුවන්විදුලි ආයතනයක පහත අංශවල කාර්යභාරය විස්තර කරන්න.
(අ) වැඩසටහන් අංශය
(ආ) දැන්වීම් අංශය

වැඩසටහන් අංශය -

- ගුවන්විදුලිය තුළ ළමා ආගමික, සංගීත වැඩසටහන් ආදී වශයෙන් විවිධ අංශ පවත්වාගෙන යයි.
- වැඩසටහන් නිෂ්පාදකවරුන් ද, නිවේදකයන් හා ඉදිරිපත් කරන්නන් ද වැඩසටහන් අංශය ද සම්බන්ධ වී කටයුතු කරනු ලැබේ.
- පිටපත් සම්පාදනය, වැඩසටහන් නිෂ්පාදනය, ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම එම අංශයට පැවරේ.
- සංස්කරණය, පෙර/ පසු නිෂ්පාදනය, සජීවී පටිගත කිරීම් වැඩසටහන් අංශයට අදාළ කාර්ය වේ.

දැන්වීම අංශය -

- ගුවන්විදුලි මාධ්‍යයේ දැන්වීම් අංශය මගින් ගුවන්විදුලි කාලය (ගුවන් කාලය) අලෙවි කරනු ලබයි.
- ගුවන්විදුලි සේවාවන් ආදායම උපයා ගන්නේ දැන්වීම් ප්‍රචාරය කිරීමෙනි.
- ඍජු දැන්වීම් මෙන්ම අනුග්‍රාහක දැන්වීම් ද ගුවන්විදුලි මාධ්‍ය තුළ බහුලව ප්‍රචාරණය කරයි.



CamScanner

- ප්‍රවෘත්ති විකාශනය වන කාල සීමාව දැන්වීම් අලෙවිය සඳහා බහුලව යොදා ගන්නා අතර එම ගුවන් කාලය වැඩි මිලකට අලෙවි වේ.
- ආයතනයේ සේවක වැටුප් හා නඩත්තු වියදම් දැන්වීම් ආදායමෙන් දරනු ලබයි.
- ගුවන් කාලය අලෙවි කිරීම සඳහා වැඩසටහන් නිෂ්පාදනයට බලපෑම් කිරීම සිදුවන්නේ දැන්වීම් අංශය මගිනි.
- ගුවන්විදුලියේ ගුවන් කාලය අලෙවි කිරීමේ වගකීම දරනු ලබන්නේ දැන්වීම් අංශයයි.
- වැඩසටහන් සඳහා අනුග්‍රාහකයන් සොයා ගැනීම සිදු කරනු ලබන්නේ දැන්වීම් අංශය මගිනි.

- ප්‍රමුඛ කාලයේ දී (Prime Time) විකාශය වන වෙළෙඳ දැන්වීම් සඳහා වැඩි මිලක් ගෙවීමට සිදු වේ.

(ලකුණු 04)

PAST PAPERS WIKI

CamScanner

7. සන්නිවේදනයේ දී නිර්මාණශීලී වීම මෙන්ම ආචාරධර්මානුකූල වීම ද වර්තමානයේ දී වැදගත් වේ.

(i) වෘත්තීය ඡායාරූප ශිල්පියකු සතු විය යුතු ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

- ඡායාරූප ශිල්පය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම
- ඡායාරූප ශිල්පය පිළිබඳ නෛතික හා සදාචාරාත්මක සීමාවන් පිළිබඳ වැටහීම
- ඡායාරූප ශිල්පය පිළිබඳ නව තාක්ෂණය හා අත්වැල් බැඳගැනීම
- ඡායාරූපකරණය පිළිබඳ ඉගෙනීමට කැමැත්තක් දැක්වීම
- නිර්මාණශීලී වීම
- සෙසු අය හා සුහදශීලීව කටයුතු කිරීමේ හැකියාව
- කලට වේලාවට වැඩ කිරීම
- ආචාරශීලී පුද්ගලයෙකු වීම
- සේවාදායක අපේක්ෂා හා ප්‍රතිචාර වෙත නම්‍යශීලී වීම
- මනා කළමනාකාරීත්වයකින් යුතු වීම

(ලකුණු 01)

**(කරුණු දෙකම නිවැරදිව නම් කර තිබේ නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.)**

(ii) සන්නිවේදන කාර්යයට අවශ්‍ය මූලාශ්‍ර **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

01. පුද්ගල මූලාශ්‍රය -

යම් අවශ්‍යතාවක් සඳහා තොරතුරු රැස්කිරීමේ දී එම තොරතුරු ලබා දෙන්නේ පුද්ගලයෙක් නම් එය පුද්ගල මූලාශ්‍රය ලෙස හැඳින්විය හැකිය.

උදා - ගුරුවරුන්, දේශපාලනඥයින්, ග්‍රාම නිලධාරින්

02. ආයතනික මූලාශ්‍රය -

තොරතුරු ලබා ගැනීමට භාවිත කරන, ආයතන ආශ්‍රිත මූලාශ්‍රය මෙයට අයත් වේ.

උදා - රාජ්‍ය අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු, පෞද්ගලික කර්මාන්ත ශාලා, සුබ සාධක සංගම්

03. මාධ්‍ය මූලාශ්‍රය -

ජනමාධ්‍ය මෙන්ම නව මාධ්‍ය ද, මාධ්‍ය මූලාශ්‍රය යටතට අයත් වේ. තොරතුරු ලබා ගැනීම සඳහා යොදා ගනු ලබන ජනප්‍රිය මූලාශ්‍ර වර්ගයකි.

උදා - රූපවාහිනී ප්‍රවෘත්ති, සමාජ ජාල වෙබ් අඩවි

04. ලිඛිත මූලාශ්‍රය -

ලිඛිත ආකාරයෙන් තොරතුරු ගබඩා කර ඇති ප්‍රභවයන් ලිඛිත මූලාශ්‍රය වර්ගයට අයත් වේ.

උදා - සංගත තැටි, චරිතාපදාන, විවිධ පත පොත

05. සංරක්ෂිත මූලාශ්‍රය -

සංරක්ෂණය කරන ලද ශ්‍රව්‍ය, දෘශ්‍ය හා ශ්‍රව්‍ය දෘශ්‍ය වැනි මූලාශ්‍ර මෙයට ඇතුළත් විය හැකිය.

උදා - ඡායාරූප, ශ්‍රව්‍ය පට, වීඩියෝ පට

(ලකුණු 02)



Past Papers Wiki
PAST PAPERS WIKI
CamScanner

**(iii) සන්නිවේදනයේ දී යොදා ගන්නා නිර්මාණාත්මක ප්‍රකාශන විධි තුනක් කෙටියෙන් විස්තර කරන්න.**

**භාෂාත්මක ප්‍රකාශන විධි -**

- භාෂාව මුල් කරගෙන සන්නිවේදනය සිදු කිරීම භාෂාත්මක ප්‍රකාශන විධි ලෙස හැඳින්වේ.
  උදා -
  උපමා උපමේය, ප්‍රස්ථා පිරුළු, කෙටි කතා, ව්‍යංගාර්ථ සහිත භාෂා රටාවන්

**ශ්‍රව්‍ය ප්‍රකාශන විධි -**

- හඬ පදනම් කරගෙන සන්නිවේදනය සිදු කිරීම ශ්‍රව්‍ය ප්‍රකාශන විධි ලෙස හැඳින්වේ.
  උදා -
  හූව, බෙර හඬ, නලා හඬ

**දෘශ්‍ය ප්‍රකාශන විධි -**

- දැකීම මගින් අවබෝධ කර ගත හැකි යම් තොරතුරක් මගින් සන්නිවේදනය කිරීම දෘශ්‍ය ප්‍රකාශන විධි ලෙස හැඳින්වේ.
  උදා -
  දැන්වීම්, ප්‍රදර්ශන පුවරු, අත් පත්‍රිකා, සඟරා, ඡායාරූප, චිත්‍ර සටහන්, සිතියම්

**ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශන විධි -**

- ශබ්දය සහ රූපය යන අංශ දෙකම යොදා ගනිමින් යම් තොරතුරක් ප්‍රකාශ කිරීම වේ.
  උදා -
  රූපවාහිනිය, සිනමාව, ජංගම දුරකථන, පරිගණකය හා අන්තර්ජාලය ආශ්‍රිත නව මාධ්‍යවල නිර්මාණ ආශ්‍රිත ක්‍රම

(ලකුණු 03)

**(iv) "නිර්මාණකරුවන්ගේ සුරක්ෂිතභාවය හා බුද්ධිමය දේපළ පනත" මැයෙන් වචන 100-150 අතර රචනාවක් ලියන්න.**

- නිර්මාණාත්මක හැකියා බුද්ධිමය දේපළක් බව
- එය සෑම පුද්ගලයෙකුටම පොදු වූ දේපළක් නොවන බව
- ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ වර්ගීකරණයට අනුව,
  - නව සොයාගැනීම් වෙළෙඳ ලකුණු හා කාර්මික සැලසුම් අයත් කාර්මික දේපළ
  - සාහිත්‍යමය, සංගීතමය, චිත්‍රමය, ඡායාරූපමය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්යන් අයත් වන ප්‍රකාශන හිමිකම් වේ.
- නිර්මාණකරුවන්ගේ සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීම තුළින් සහ ඔවුන්ගේ නිර්මාණයට අදාළ සාධාරණ ගෙවීම්, නිර්මාණ අගය තහවුරු කිරීම සඳහා කටයුතු කළ යුතුය.
- නිර්මාණකරුවන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම 1948 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රකාශනය සහ 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත මගින් තහවුරු කර ඇත.
  උදා -
  1948 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රකාශනයේ 27 වන වගන්තිය 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනතේ 6 (1) වගන්තිය.
- බුද්ධිමය දේපළ සම්බන්ධ අයිතිවාසිකම් දෙවර්ගයක් පවතින බව (ආර්ථික අයිතිවාසිකම් සහ සදාචාර අයිතිවාසිකම්)
- ප්‍රකාශන හිමිකම් පිළිබඳ නීතියෙන් නිර්මාණකරුවා සතු බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම සිදුවන බව.

(ලකුණු 04)

***

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library
CamScanner